# පටිපත්ති සංග්‍රහය සහ උපාසක ජනාලංකාරය අතර ඇති සබඳතාව

ඇකිරියේ සෝමානන්ද හිමි

'පටිපත්ති සංගහ' යනු පාලි භාෂාවෙන් රචිත ඉතා පැරණි පුස්කොළ පොතකි. එහි සිංහල නාමය වන්නේ ප්‍රතිපත්ති සංග්‍රහය යන්නය. උපාසක ජනාලංකාරය ඉංග්‍රීසි භාෂාවෙන් සංස්කරණය කරන සද්ධාතිස්ස හිමියන් මෙම කෘතිය සඳහා යොදා ඇති නාමය වන්නේ 'The Compendium of the Practices'[1] යන්නය. එහෙත් එය තවදුරටත් කතුවරයාගේ අරමුණත් සමග ගැලපීමේදී 'The Compendium of the Buddhist Practices for the Lay Disciples' ලෙස සකසා ගැනීම වඩාත් යෝග්‍ය බව අපගේ අදහසයි. ප්‍රධාන වශයෙන්ම මෙම කෘතිය පරිච්ඡේද හයක් යටතේ සංග්‍රහ වී ඇති විශාල එකකි. සෑම පරිච්ඡේදයක්ම 'සංගහ' යනුවෙන් හඳුන්වා තිබීම ද එහි විශේෂතාවකි.

1 සරණාගමන සංගහ

2 සීල සංගහ

3 ආදීනව සංගහ

4 ධුතාංග සංගහ

5 සමථාභිඤ්ඤා සංගහ

6 පත්ති සංගහ

එහෙත් ග්‍රන්ථාරම්භයේ දැක්වෙන විස්තරයකයට අනුව මීට සමාන නමුත් වෙනත් ආකාරයේ පරිච්ඡේද පහක් යටතේ මේ කෘතිය සංග්‍රහ කර ඇති බව දක්වයි. එනම්

1 සරණාගමන සංගහ

2 සීල සංගහ

3 සමාධි සංගහ

4 පඤ්ඤා සංගහ

5 ආනිසංස සංගහ යනුවෙනි.

කතුවරයා ද දක්වන ආකාරයට මෙම බෙදීම් ක්‍රම දෙක සංසන්දනය කොට මෙලෙස දැක්විය හැක. පළමු පරිච්ඡේද දෙක සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් ඇති නොවන අතර තුන්වැනි සමාධි සංග්‍රහය යටතේ පරිච්ඡේද තුනක් අන්තර්ගතය. ඒවා නම් ආදීනව,

ධුතාංග හා සමථාභිඤ්ඤා යන පරිච්ඡේද තුනයි. කතුවරයා දක්වන ආකාරයට සමාධි සංග්‍රහය නාමිකව ආදීනව සංග්‍රහයෙන් ආරම්භ වුවත් එහි භාරකාරිත්වය දරන්නේ පස්වැනි වූ සමථාභිඤ්ඤා සංග්‍රහයයි. සිව්වැනි පඤ්ඤා කොටස ආවරණය කිරීම සඳහා හයවැනි පරිච්ඡේදය වන පත්ති සංග්‍රහය මගින් සිදුවෙයි. පස්වැනි වර්ගීකරණය ආනිසංස පිළිබඳවයි. ඒ සඳහා උපයෝගි කරගත යුත්තේ පස්වැනි හා හයවැනි පරිච්ඡේද දෙකයි. පස්වැනි පරිච්ඡේදයේ අග ආනිසංස සංග්‍රහය නමින් කෙටි විස්තරයක් දක්වන අතර එමගින් විස්තර කරන්නේ සමථ භාවනාවෙහි ආනිසංස පහකි. එමෙන්ම හයවැනි පරිච්ඡේදයේ ද අග ආනිසංස සංග්‍රහය නමින් කෙටි විස්තරයක් දැක්වෙන අතර එහි විස්තර වන්නේ පඤ්ඤා භාවනාවෙහි හෙවත් විදර්ශනාවෙහි ආනිසංස හතරකි.

කෘතිය පිළිබදව යම් අවබෝධයක් ලබා ගැනීම සදහා ප්‍රාරම්භ හා නිගමන ගාථා ඉතා වැදගත්ය. ප්‍රාරම්භ ගාථාවලට අනුව ඛුද්දකපාඨ අට්ඨකථා ආදියෙහි අන්තර්ගත ධර්ම කරුණු ද ඇතුළත් කොට ගිහි උපාසක-උපාසිකාවන් වෙනුවෙන්ම ලියන කෘතියක් බව දක්වයි. නිගමන ගාථා දක්වන ආකාරයට මෙය රචනා කරන ලද්දේ කාශ්‍යප නම් යුවරජෙකුගේ ආරාධනාවෙනි. එමෙන්ම මෙය බණවර පහළවකින් යුක්ත වූ කෘතියකි. තවද අතිරේකයකින් ද පරිපූර්ණය.

බෞද්ධ උපාසක-උපාසිකා යන උභය පක්‍ෂය මූලිකවම අරමුණුකොට මෙම ප්‍රතිපත්ති සංග්‍රහය රචනා කරනලදි. ඒ සඳහා අවශ්‍යකරන ධර්ම කොටස් ත්‍රිපිටකාගත සූත්‍ර මගින් ලබාගෙන ඒවාට අදාළ අටුවා ආදි තොරතුරු ද මනාව අධ්‍යයනය කර මෙම කෘතිය සකස්කරන ලද බව පැහැදිලිය. ගිහියන් වෙනුවෙන්ම දහම් උපදෙස් ලබාදීමේ අරමුණ ඇතිව ලියන ලද මුල්ම කෘතිය මෙය වීම විශේෂතාවකි. මෙකී අරමුණම ඇතිව පසුකාලීනව ලියන ලද උපාසක ජනාලංකාරය ආනන්ද නම් පැවිදි ආචාර්යවරයකුගේ කෘතියකි.

පටිපත්ති සංග්‍රහයෙහි පළමු හා දෙවන පරිච්ඡේද දෙක සකස් කිරීමේදී කතුවරයා පරමත්ථජෝතිකා හෙවත් ඛුද්දකපාඨ අටුවාව උපයෝගිකරගෙන ඇති අයුරු පැහැදිලිය. එය නාමිකව ප්‍රාරම්භ ගාථාවක සටහන් කිරීමට ද කතුවරයා අමතක කර නැත. එහෙත් කෘතිය මනාව පරිශීලනය කිරීමෙන් පසු පැහැදිලිවන කරුණක් නම් පටිපත්ති සංග්‍රහය රචනා කිරීම සඳහා පුරෝගාමී සහාය ලබාගෙන



ඇත්තේ අටුවාචාරි බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධි මාර්ගයෙන් බවයි. එහෙත් එම නාමය ප්‍රාරම්භ ගාථාවක හෝ නිගමන ගාථාවක සදහන් නොවීම කතුවරයාගේ අඩුපාඩුවක් ලෙස ද සිතිය හැක. විසුද්ධි මාර්ගය පරිච්ඡේද විසිතුනකින් යුක්තය. ඒ අතරින් පරිච්ඡේද දහනවයක්ම යොදාගෙන පටිපත්ති සංග්‍රහය සකස්කර ඇති බව මනාව පැහැදිලිය.

දෙවන පරිච්ඡේදය වන සීල සංග්‍රහය සකස්කිරීමේදී සීලයේ ප්‍රභේද, ආනිසංස මෙන්ම එය කිලිටි වන අයුරු විස්තර කිරීමේදී කතුවරයා විසුද්ධි මාර්යට අනුගතව ධර්ම කරුණු විස්තර කර ඇත. සිව්වන පරිච්ඡේදය වන ධුතාංග සංග්‍රහය සකස්කිරීම සදහා විසුද්ධි මාර්ගයේ ධුතාංග නිර්දේශය සම්පූර්ණයෙන්ම ආශ්‍රය කරගෙන ඇති අයුරු දැක ගත හැක. වෙනසකට ඇත්තේ ගිහියන්ට සෘජුවම අදාල කරගත හැකි ධුතාංග දෙකක් පමණක් (එකාසනිකංග හා පත්තපිණ්ඩිකංග) පටිපත්ති සංග්‍රහයෙහි අන්තර්ගත කිරිමයි. පස්වැනි පරිච්ඡේදය සකස්කිරීමේදී විසුද්ධි මාර්ගයෙහි පරිච්ඡේද එකොළහක් (3 සිට 13) සෘජුවම යොදාගෙන ඇත. පඤ්ච විසුද්ධි (සීල හා චිත්ත විසුද්ධි හැර) දැක්වීම අරමුණු කරගත් අවසාන පරිච්ඡේදය පත්ති සංග්‍රහය ලෙස දක්වයි. විසුද්ධි මාර්ගයේ නිර්දේශිත සීල-සමාධි-පඤ්ඤා යන ත්‍රිශික්‍ෂාව පදනම් කරගත් ක්‍රමවේදය එලෙසම පටිපත්ති සංග්‍රහය යොදාගෙන ඇති අතර අවසාන පරිච්ඡේදය නිමවා ඇත්තේ පඤ්ඤා නිර්දේශයේ අන්තර්ගත ධර්ම කරුණු ආශ්‍රයෙනි.

එමෙන්ම තෙවන පරිච්ඡේදය රචනා කිරීම සදහා දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍රය උපයෝගි කරගනියි. එය නමින් ආදීනව සංග්‍රහය නම් වෙයි. එම සූත්‍රයේ බෞද්ධ උපාසක-උපාසිකාවන් කළ යුතු හා නොකළ යුතු දෑ විස්තර වෙයි. එමෙන්ම මීට අදාළ දීඝ නිකාය අටුවාව ද ආශ්‍රය කරගනිමින් ධර්ම කරුණු විස්තර කරයි. මෙම සූත්‍රය ආශ්‍රය කරගෙන වෙනම පරිච්ඡේදයක් සකසා ඇත්තේ ගිහියන් සදහා රචනා කරන කෘතියක විශේෂයෙන්ම අන්තර්ගත කළහැකි ධර්මකරුණුවලින් මෙම සූත්‍රය පොහොසත් නිසාය.

කතුවරයා හා කාලය සම්බන්ධයෙන් කිසිදු සඳහනක් කෘතියෙහි සඳහන්ව නැත. එහෙත් එහි නිගමන ගාථාවක එය රචනා කරන ලද්දේ කාෂ්‍යප නම් යුවරජකෙනෙකුගේ ආරාධනාවෙන් බව මුලින් සඳහන් විය. ලංකා ඉතිහාසය පිරික්සීමේදී යුවරජ පදවිය ද දරණලද කාශ්‍යප නමින් රට පාලනය කළ රජවරු තිදෙනෙකි.[2]

1 කාශ්‍යප ii (650-659)

2 කාශ්‍යප iv (898-914)

3 කාශ්‍යප v (914-923)

මේ කාශ්‍යප යුවරජවරු සම්බන්ධයෙන් අදහස් දක්වන පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ප්‍රකාශ කරන්නේ මෙය රචනා කිරීම සඳහා ආරාධනා කරන ලද්දේ දෙවැනි කාශ්‍යප යුවරජු බවයි.[3] පරණවිතාන මහතා සිතන්නේ මෙය රචනා කිරීම සඳහා ආරාධනා කරන ලද්දේ පස්වැනි කාශ්‍යප යුවරජු බවයි.[4] තවදුරටත් කරුණු දක්වන හෙතෙම ප්‍රකාශ කරන්නේ මේ රජු යුවරජකාලයේ සිටම පොත්පත් ගැන උනන්දුවක් දැක් වූ පාලි උගතෙකු මෙන්ම ගත්කතුවරයෙකු ද බවයි. බුද්ධ ධර්මය පිළිබඳ ඔහු තුළ තිබූ හසල බුද්ධිය ධම්පියා අටුවා ගැටපදය පිරික්සීමෙන් මනාව පැහැදිලි වන අතර එය මේ රජුගේ කෘතියක් බව ඩී. බී. ජයතිලක මහතා පවසයි.[5]

මෙම කෘතියෙහි භාෂා ව්‍යවහාරය විමසීමේදී පැහැදිලි වන්නේ එය පාලි අටුවා සම්ප්‍රදායට නෑකම් කියන භාෂා ලක්‍ෂණවලින් යුක්ත වූ ව්‍යවහාරයක් බවයි. ඊට බලපෑ මූලිකම සාධකය වන්නට ඇත්තේ විසුද්ධි මාර්ගය ආදිකොට ඇති අටුවා ග්‍රන්ථවල ආභාෂය ඉතා ඉහලින්ම උපයෝගිකරගත් නිසා විය හැක. පාලි ශබ්ද, පද හා වාක්‍ය විමසීමෙන් ගම්‍යවන්නේ එවා පාලි රීතියට අනුගතව සකස්කොට ඇති බවයි.

පටිපත්ති සංග්‍රහයෙහි අවසානයේ සඳහන් වන්නේ 'පටිපත්ති සංගහං නාම පකරණං' යනුවෙනි. විවිධ අර්ථ දීම සදහා පාලියේ එය යෙදී ඇතත් අභිනවයෙන් සකස් කරගත් ග්‍රන්ථයක් යන අදහසින් මේ නමින් හඳුන්වන්නට ඇතයි සිතිය හැක. තුන්පිටකයටම අයත් සූත්‍රාගත ධර්ම කරුණු අනතර්ගත කොට ඇති මෙය සමහර අටුවා ද පරිශීලනය කළ බව පැහැදිලි කරුණකි. බෞද්ධ උපාසක-උපාසිකාවන් සදාචාර සම්පන්නව ප්‍රතිපත්ති මාර්ගයට යොමු කිරීමේ අදහසින් නිර්මිත මෙම කෘතිය ඉතා වටිනා පාලි ප්‍රකරණ ග්‍රන්ථයක් ලෙස අගය කළ හැක.

ගිහි උපාසක-උපාසිකාවන් සඳහාම රචනා කරනලද උපාසක ජනාලංකාරය පරිච්ඡේද නවයකින් යුත්තය. ඒවා මෙසේය.

1 සරණ නිර්දේශය
2 සීල නිර්දේශය
3 ධුතාංග නිර්දේශය
4 ආජීව නිර්දේශය
5 දස පුණ්‍යක්‍රියා වස්තු නිර්දේශය



6 අන්තරායකර ධර්ම නිර්දේශය
7 ලෞකික සම්පත්ති නිර්දේශය
8 ලෝකෝත්තර සම්පත්ති නිර්දේශය
9 පුණ්‍යඵල සාධක නිර්දේශය

මෙහි කතුවරයාම ග්‍රන්ථ ප්‍රාරම්භ ගාථාවක දක්වන ආකාරයට, මෙම නව කෘතිය ගිහියන් වෙනුවෙන්ම සකස්කරන්නේ පුරාණ පටිපත්ති සංග්‍රහය බලා එහි දෘෂ්‍යමාන අඩුපාඩු මැකීම සඳහාය. ඔහු කියන්නේ එහි නිදාන කථාවක් නොමැති හෙයින් ද විවරණ මාධ්‍යයන්හි ඇති අවුල් සහගත තත්ත්වය නිසා ද බුදුන්ගේ ධර්මයට නැඹුරුවක් දක්වන නවකයන්ට එය ගොචර නොවන බවයි[6]. ඒ අනුව පැහැදිලි වන්නේ පටිපත්ති සංග්‍රහයෙහි අඩුපාඩු සහිත බැවින් එය වෙනුවට එයම ආශ්‍රය කරගෙන ගිහියන් සදහා මෙය රචනා කරන බවයි.

ග්‍රන්ථය අවසානයේ දැක්වෙන ආකාරයට මෙහි කතුවරයා ආනන්ද මහා ථේර නම් ශ්‍රී ලාංකික ආචාර්යවරයෙකි[7]. මේ හිමියන් කොත්මලේ ප්‍රදේශයේ උසස් විහාරයක් වූ පෙරුම්පල්ලි විහාරයේ (13 වන සියවස) ජීවත් වූ බව ශ්‍රී ලාංකික උගතුන්ගේ පොදු පිළිගැනීමයි[8]. 1930 පමණ සිංහල උපාසක ජනාලංකාරය සංස්කරණය කළ ජෝතිරතන හිමියන් ද එහි පෙරවදනෙහි මේ අදහසම දක්වයි. ග්‍රන්ථ අවසානයේ දැක්වෙන ආකාරයට මේ පෙරුම්පල්ලි නම් මනහර වූ විහාරය පණ්ඩු රාජ්‍යයෙහි සිරිවල්ලභ නගරයේ ඉදිකොට ඇත්තේ චෝලගංග නම් ප්‍රාදේශීය රජෙකු විසිනි.

මෙම කතුවරයා සිය කෘතිය සම්පාදනය කිරීම සදහා පටිපත්ති සංග්‍රහය මගින් ලබාගෙන ඇති ණයගැති භාවය පළමු පරිච්ඡේද හතර සැසදීමෙන් මනාව තේරුම් කර ගත හැක. පටිපත්ති සංග්‍රහයෙහි පළමු පරිච්ඡේදය සරණාගමන සංග්‍රහය වන අතර උපාසක ජනාලංකාරයෙහි පළමු පරිච්ඡේදය වන සරණ නිර්දේශය සැකසීම සදහා එය සපුරා අධ්‍යයනය කළ බව අමුතුවෙන් කියයුතු නැත. දෙවන පරිච්ඡේදය වන සීල නිර්දේශය සකසා ගැනීම සදහා පඤ්ච ශීලය හා උපෝසථ ශීලය පිළිබඳව විස්තර විශේෂයෙන්ම ගෙන ඇත්තේ දෙවන පරිච්ඡේදය වන ශීල සංග්‍රහයෙනි. උපාසක ජනාලංකාරයෙහි තෙවන පරිච්ඡේදය ධුතාංග නිර්දේශය වන අතර පටිපත්ති සංග්‍රහයෙහි සිව්වන පරිච්ඡේදය ධුතාංග සංග්‍රහයි. කතුවරයා පටිපත්ති සංග්‍රහය එලෙසින්ම අනුගමනය කරමින් ගිහියන් සදහා ඍජුවම අදාළ කරගත හැකි ධුතාංග දෙක

පමණක් විස්තර සහිතව සඳහන් කරයි. සිව්වන පරිච්ඡේදය ආජීව නිර්දේශයයි. තම ජීවිතය ධර්මානුකූලව සාර්ථක කර ගැනීමට බලපාන, නොයෙක් සමාජ ස්ථර සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට අවශ්‍ය කරන උපදෙස් හා මගපෙන්වීම්, දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍රය මූලික කරගෙන එහි අන්තර්ගතය. ආනන්ද හිමියන් ඒ සියලු විස්තර ගෙන ඇත්තේ පටිපත්ති සංග්‍රහයෙහි තෙවන පරිච්ඡේදයේ එන ආදීනව සංග්‍රහයෙහි අන්තර්ගත ධර්ම කොටස්මය.

අටුවාචාරි බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධි මාර්ගය ගුරුපොත සේ ගෙන ගිහියන් සඳහා විශේෂයෙන්ම සකස්කරන ලද පළමු කෘතිය පටිපත්ති සංග්‍රහයයි. විසුද්ධි මාර්ගයේ දැක්වෙන නිර්වාණගාමී මාර්ගය වන සීල සමාධි පඤ්ඤා යන ත්‍රිශික්ෂා පදනම් කරගෙන ගිහි උපාසක-උපාසිකාවන්ට නිවන් මග පහදා දීමේ අරමුණ ඇතිව පටිපත්ති සංග්‍රහය රචනා කරන ලද බව පැහැදිලියි. එය ලෝකෝත්තර අරමුණක් කරා සෘජු වූ ගමන් මග විවර කරයි. එහෙත් එය ආශ්‍රයෙන්ම පසුකාලීනව ලියන ලද උපාසක ජනාලංකාරය උපාසක-උපාසිකාවන්ගේ ලෞකික ජීවිතය අරමුණුකරගෙන ලියන ලද කෘතියක් සේ දිස්වෙයි. පරිච්ඡේදකරණය හා එහි අන්තර්ගතය විමසා බැලීමෙන් මේ කරුණු මනාව පැහැදිලි කරගත හැක. තත්කාලීන සමාජ පරිසරයේ බලපෑමෙන් එය සිදුවන්නට ඇතිබව සිතිය හැක.

**ආන්තික සටහන්**

---

[1] Saddhatissa, Rev. H. 1965: *Upāsakajanālaṃkāra; A Critical Edition and Study,* London: 49 p

[2] *A Concise History of Ceylon*, Colombo, 1961

[3] බුද්ධදත්ත හිමි, 2007: *පාලි සාහිත්‍යය*, රත්න ප්‍රින්ටර්ස්, කොළඹ: පිට 415

[4] හේමචන්ද්‍රරාය (සංස්), 1964: *ලංකා විශ්ව විද්‍යාල ලංකා ඉතිහාසය*, vii පරිච්ඡේදය, කොළඹ: පිට 375

[5] හෙට්ටිආරච්චි, ඩී ඊ 1974: *ධම්පියා අටුවා ගැටපදය*, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල මුද්‍රණාලය: පිට lviv

[6] Saddhatissa, Rev. H. 1965: *Upāsakajanālaṃkāra; A Critical Edition and Study,* London: 123 p

[7] Ibid, 358 p

[8] Godakumbura, C. E. 1955: *The Sinhalese Literature*, Colombo: 54 p